ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකः 2477424, 2477423, 2477311
ෆැක්ස්ः 2346257, 2477739
ඊ-මේල්ः dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියः www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2013 ජූලි 26** |

## බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් සිය ණය සහ අත්තිකාරම් මත අය කරනු ලබන දඩ පොලී අනුපාතයට මහ බැංකුව සීමාවක් පනවයි

බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් විසින් අය කරනු ලබන දඩ පොලී අනුපාතික අතිශයින්ම ඉහළ අගයක් ගන්නා බව සහ එම පොලී අනුපාතික කල් පසු වූ ණයගැතියන්ට අයුතු බර පැටවීමක් බවට පත්වන බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත. තවද, මෙවැනි ඉහළ පොලී අනුපාතිකයන් රට තුළ ව්‍යවසායකත්වය දියුණු වීමේ හැකියාව වලක්වයි. එවැනි ඉහළ පොලී අනුපාතික හේතුවෙන් ණයගැතියන්ට ණය ආපසු ගෙවීමට නොහැකි වීම බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම්හි මූල්‍ය තත්ත්වයට මෙන්ම මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට අහිතකර ලෙස බලපෑ හැක.

මේ සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද සමීක්ෂණයකදී හෙළි වූයේ, දැනට බැංකු විසින් අතපසු වූ හිඟ ණය සහ ඇතැම් විට මුළු හිඟ ණය ප්‍රමාණයම මත අය කරනු ලබන දඩ පොලී අනුපාතිකය, ණය මුදල මත අය කරනු ලබන මූලික පොලී අනුපාතිකයට අමතරව වසරකට සියයට 2 සිට සියයට 20 අතර පරාසයක පවතින බවයි. තවද, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් මගින් අයකරනු ලබන සාපේක්ෂ පොලී අනුපාතික වඩාත් ඉහළ අගයක් ගනී. එසේම, බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම්, කල්බදු පහසුකම් සම්බන්ධයෙන් කල් ඉක්මවූ බදු කුලී මත අය කරනු ලබන දඩ පොලී අනුපාතය, මූලික පොලී අනුපාතිකයට අමතරව වසරකට සියයට 36 සිට සියයට 48 අතර පරාසයක පවතී.

එසේ හෙයින්, මෙම තත්ත්වය, දැනට රට තුළ පවත්නා අඩු පොලී අනුපාත වාතාවරණය සහ අනෙකුත් නැගී එන ආර්ථික තුළ පවත්නා අඩු පොලී අනුපාත එනම් වසරකට සියයට 4 සිට 12 අතර පරාසයක පවතින ණය පොලී අනුපාතික සහ සාපේක්ෂව බෙහෙවින් පහත අගයක පවතින දඩ පොලී අනුපාතික, සමඟ නොගැලපෙන බව පැහැදිලි වේ.

ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරුව, 2013 අගෝස්තු 01 දින සිට බැංකු දැනට ලබා දී ඇති ණය පහසුකම් ද ඇතුලත්ව, සියළුම ණය සහ අත්තිකාරම් මත අයකරනු ලබන දඩ පොලී අනුපාතිකය, ණය නොගෙවූ කාලපරිච්ඡේදය ඇතළත අතපසු වූ හිග ණය මුදලට වසරකට සියයට 2 නොඉක්මවන මට්ටමක පවත්වාගෙන යායුතු බව ද, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් විසින් අයකරනු ලබන දඩ පොලී අනුපාතිකය වසරකට සියයට 3 නොයික්මවන මට්ටමක පවත්වාගෙන යායුතු බව ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් වෙත දන්වා ඇත.

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය වඩා ශක්තිමත් කිරීමට අමතරව, මෙම නිර්දේශ මගින්, බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් විසින් ණය දීම විචක්ෂණ සහ ඵලදායී ලෙස වර්ධනය කිරීමෙන්, මධ්‍ය සහ දිගුකාලීන සාර්ව ආර්ථික අභිප්‍රායන් හා එක් තලයක පිහිටමින් රට තුළ ආර්ථික කටයුතු වර්ධනය වීමක් අපේක්ෂා කෙරේ.